**ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

රත්නපුරදිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍යප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍යප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම,විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර,මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමහෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍යප්‍රකාශන සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සඳහන් සංඛ්‍යා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශ සමග එකඟ විය යුතු වුවද, තැන්පත් ලැබීම් භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශය අනුව රු.483,412,888ක් වී තිබුණත් එය රු.156,110,805 ක් අඩුවෙන් රු.327,302,083ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම. | අදාළ මුදල් වටිනාකම් වගුවේ ඇතුළත් කිරීමේ දී ඇතුළත් කළ යුතු ස්ථාන මාරු කර සටහන් කිරීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබුණි. |
| (ආ) ඉහත (අ) හි සඳහන් නිරීක්ෂණය හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු. 3,724,099,617ක් විය යුතුව තිබුණත්, එය රු.3,567,988,812ක් වශයෙන් දක්වා තිබුණි. | - ඉහතපරිදි - | අදාළ මුදල් වටිනාකම් වගුවේ ඇතුළත් කිරීමේ දී ඇතුළත් කළ යුතු ස්ථාන මාරු කර සටහන් කිරීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබුණි. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් සංඛ්‍යා සමඟඑකඟ විය යුතු වුවත්, | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාළ මුදල් වටිනාකම් වගුවේ ඇතුළත් කිරීමේ දී ඇතුළත් කළ යුතු ස්ථාන මාරු වී සටහන් වීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබීම. |

| | | | |
|---|---|---|---|
| | හාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශය අනුව තැන්පත් ගිණුමේ ශේෂය රු.327,302,083ක් වී තිබුණත් එය රු.156,110,780කින් වැඩියෙන් රු.483,412,863ක් ලෙස දක්වා තිබුණි. | | |
| (ආ) | ඉහත (අ) හි සඳහන් නිරීක්ෂණය හේතුවෙන් ශුද්ධ වත්කම්වල වටිනාකම රු.113,093,943 ක් විය යුතුව තිබුණත් එය රු.269,204,723ක් ලෙස දක්වා තිබුණි. | - ඉහතපරිදි - | ඉදිරියේ දී මෙම තත්ත්වය හාණ්ඩාගාර උපදෙස් මත මග හරවා ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සමග සංසන්දනාත්මකව ඉදිරිපත් කර තිබුණු 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය හා 2018 මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 6 ආකෘතියේ 2018 ජනවාරි 01 දිනට එම ශේෂ අතර රු.1,213,199,114ක වෙනසක් පැවතුණි. | කාර්යාල පොත්පත් හා ලේඛන සමහ සසඳා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | විගණනයෙන් පෙන්වා ඇති කරුණු නිවැරදිය. |
| (ඈ) | මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබා දී ඇති කේවල තොරතුරුවල සාරාංශය හා මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ - 6 ආකෘතියඅනුව ශේෂයන් අතර අවස්ථා 12ක දී රු.2,865,573,937ක වෙනසක් පැවතුණි. | කාර්යාල පොත්පත් හා ලේඛන සමහ සසඳා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී 2017 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂ දක්වා තිබුණ ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නැවත තක්සේරු කිරීමෙන් ලබාගත් අගයන් විගණනය වෙත ලබා දී තිබීම. |
| (ඉ) | විගණනයට ඉදිරිපත් කර තිබුණු පොදු තැන්පත් ගිණුම් සැසඳීමේ ප්‍රකාශය අනුව ශේෂයන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබාගත් තොරතුරු අනුව ශේෂයන් සමහ සැසඳීමේ දී රු.373,237ක වෙනසක් අනාවරණය විය. | කාර්යාල පොත්පත් ලේඛනසමහ සසඳා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | මෙම වෙනසට හේතුව වැය විෂය අංක 6000-18-0-12 හා 6000-13-0-27 දරන පොදු තැන්පත් ගිණුම්, සැසඳුම් ප්‍රකාශය අනුව පෙන්නුම් නොකිරීම. |
| (ඊ) | අංක 258/2017 හා 2017 ඔක්තෝබර් 16 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2.7 ඡේදය පරිදි තැන්පතු කාණ්ඩ 6003හි ශේෂය පියවා අවසන් කළයුතු වුවද, රු. | අංක 258/2017 හා 2017 ඔක්තෝබර් 16 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2.7 ඡේදය ප්‍රකාරව කටයුතු කළ | මෙම ඍණ ශේෂය 2018 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා මහා හාණ්ඩාගාරය |

| | | | |
|---|---|---|---|
| | 108,030ක ඍණ ශේෂයක් තවදුරටත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් පැවතිණි. | යුතු ය. | දැනුවත් කර ඇති බව |
| (උ) | අත්තිකාරම්ගිණුම සහ කේවල ශේෂ වර්ගීකරණයන් අනුව උත්සව අත්තිකාරම්, දේපල ණය, මෝටර් රථ ණය, ආපදා ණය හා වෙනත් ණය යටතේ පිළිවෙලින් රු. 136,880, රු. 796,776, රු. 248,880, රු. 16,101,096 හා රු. 1,694,774ක් වශයෙන් වෙනස්කම් නිරීක්ෂණය විය. | කාර්යාල පොත්පත් ලේඛන සසදා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. | ඡේදය පිළිගෙන ඇති අතර වෙනස්කම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් සිදුකර ඇත. |

**1.6.3** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ ආදායම් නොවන ලැබීම් ලෙස රු.6,669,526,436ක් දක්වා තිබුණත්, විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව එය රු.6,588,627,790ක් වී තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. | විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරුවල අගය වන රු.6,588,627,790 කට අත්තිකාරම් ගිණුම්වලින් ලැබීම් අගය වන රු.80,898,646 ක් එකතු කර සමස්ථ ලැබීම් රු.6,669,526,436 ක් දක්වා ඇත. |
| (ආ) | විගණනයට ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ අනුව රු.453,036,874ක තැන්පතු ගෙවීම් සිදුකර තිබුණත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කළ මුදල් ප්‍රවාහයේ එම වටිනාකම සඳහන් කර නොතිබුණි. | - ඉහත පරිදි - | රු.453,036,874 ක තැන්පතු ගෙවීම් මුදල් ප්‍රවාහය සකස් කිරීම සඳහා ලබා දී ඇති ආකෘති පත්‍රය අනුව මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය තළ මුදල් ප්‍රවාහයේ තැන්පතු ගෙවීම් හා අනෙකුත් වගකීම් වෙනස්වීම් යටතේ දක්වා ඇති රු.4,203,597,322 ක මුදලට ඇතුළත් කර ඇත. |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.80,898,646ක් හා රු.82,968,771 ක් වී තිබුණත්, එම | - ඉහත පරිදි - | අත්තිකාරම් ලැබීම් අගය වන රු.80,898,646 ක මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් ලැබීම් යටතේ ආදායම් නොවන ලැබීම් ලෙසද, අත්තිකාරම් |

| | | | |
|---|---|---|---|
| | සටහන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ හා ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයේ දක්වා නොතිබුණි. | | ගෙවීම් රු.82,968,711 ක වටිනාකම මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ඇති මුදල් වැයකිරීම් ගෙවීම් තැන්පතු හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම් යටතේ දක්වා ඇත. |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දී පුද්ගල පඩිනඩි, මෙහෙයුම් වියදම්, සහනාධාර, මාරු කිරීම් සහභෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් සඳහා එකතුව රු.6,133,511,105ක් වැයකරතිබුණත්, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එකතුව රු.2,465,919,428ක් වශයෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය වන රු.723,913,817 ක් හා භෞතික වත්කම් ඉදිකිරීම් වෙනුවෙන් වූ රු.1,742,005,611 ක් හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ රු.4,203,597,322 ක එකතුවෙන් ප්‍රධාන ලෙජර් වියදම් අගය වූ රු.536,005,645 ක් අඩු කිරීමෙනි. |
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරකම්වල නිරත වී නොතිබුණත් ඒ යටතේ රු.4,203,597,322ක් දක්වා තිබුණි. | - ඉහත පරිදි - | විගණනය විසින් පෙන්වා දී ඇති රු.4,203,597,322 ක මුදල මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ දක්වා ඇත. |
| (ඊ) | 2018 වර්ෂයේ මූල්‍යප්‍රකාශනවල ඒසීඒ 6 ආකෘතියෙහි දක්වා තිබුණු රු.764,841ක වත්කම් විකිණීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා නොතිබුණි. | වත්කම් විකිණීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වශයෙන් දැක්විය යුතු ය. | ඒසීඒ 6 ආකෘතියෙහි දක්වා ඇති රු. 764,841ක වත්කම් විකිණීමෙන් ලද මුදල් වෙනත් ලැබීම්වල අඩංගු බැවින් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නැත. |

**1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| XIX පරිච්ඡේදයේ5 වගන්තිය | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රකාරව නිල නිවාස කුලී ගණනය නොකිරීම නිසා 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එකතුව රු.542,929ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි. | ආයතන සංග්‍රහයේවිධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | හිඟ නිල නිවාස කුලී ගණනය කර අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| XIX පරච්ඡේදයේ 4.4 වගන්තිය | නිල නිවාස කමිටු වාර්තා පොත යාවත්කාලීන කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XIX වැනිපරිච්ඡේදයේ 4.4 වනවගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. | නිවාස කමිටුවක් පිහිටුවා ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගැනීම. |

**1.6.5 අවිධිමත් ගනුදෙනු**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) රත්නපුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ගං වතුර ආපදාවෙන් හානියට පත් භාණ්ඩ වෙනුවෙන් වන්දි ගෙවීමේ දී ඒ සම්බන්ධයෙන් පත්කල කමිටුවේ සහ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශ මත අදාළ ප්‍රතිලාභීන් ඉල්ලුම් කළ උපරිම වටිනාකම ද ඉක්මවා අවස්ථා 49ක දීරු.2,088,965ක් වන්දි වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි 104, 109 හා 156 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | චක්‍රලේඛ ප්‍රකාරව ගෙවීම් කිරිමට උපදෙස් දී ඇති බවත් එකි උපදෙස්වලට අනුව කටයුතු කර ඇත්ද යන්න පිළිබඳව පරික්ෂණයක් සිදුකිරීම. |
| (ආ) 2017 වර්ෂයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ගං වතුරෙන් හානියට පත් නිවාස සඳහා වන්දි ගෙවීමේ දී 2017 ජූනි 25 දිනැති අංක NDRSC/01/04/01/2017දරන චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව වසම් 09ක නිවාස 31කට අදාළවරු.1,187,711ක් වැඩිපුර ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි 104, 109 හා 156 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | චක්‍රලේඛ ප්‍රකාරව ගෙවීම් කිරිමට උපදෙස් දී ඇති බවත් එකි උපදෙස්වලට අනුව කටයුතු කර ඇත්ද යන්න පිළිබඳව පරික්ෂණයක් සිදුකරීම. |
| (ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 03ක් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක් වෙත විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදනයන්ට අනුකූලව කර්මාන්ත 18ක වැය විෂයයන් 20ක් ඉටු කිරීම සඳහා එකතුව රු.25,817,599කට ගිවිසුම්වලට එළඹ තිබුණි. එසේ එළඹ තිබුණු ගිවිසුම්වලට අදාළව මිනුම් කිරීමේ දී රු.361,267ක් වැඩිපුර ගෙවා තිබුණි. ඉන්රු.15,278ක් අයකරගෙන තිබුණි. ඉතිරි රු.345,989ක් තවදුරටත් | මුදල් රෙගුලාසි 104, 109 හා 156 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් වෙනත් කාර්යාලයකට අනුයුක්ත තාක්ෂණික නිලධාරියෙකු ලවා පරීක්ෂණයක් සිදුකර වැඩිපුර මුදල් ගෙවීමක් සිදුකර ඇත්නම් අදාළ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම. |

අයකරගත යුතුව තිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් වෙත රු.2,019,865ක ගිවිසුම්ගත කර්මාන්ත 04ක් ඉටුකිරීම සඳහා ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම කාර්යයන්ට එරෙහිව පෞද්ගලික නිවාසවලට අදාළව කරන ලද කොන්ක්‍රීට් කිරීම් සඳහා කියුබ් 14.046ක කොන්ක්‍රීට් යොදාගෙන තිබුණු අතර, ඒ සඳහා රු. 193,307ක් ගෙවා තිබුණි. | පරීක්ෂණ පවත්වා වැඩිපුර ගෙවා ඇති මුදල් අදාළ පාර්ශවයන් වෙතින් අයකර ගැනීම කළ යුතුවීම. | පරීක්ෂණයක් සිදුකර වැඩිපුර මුදල් ගෙවීමක් සිදුකර ඇත්නම් අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඉ) | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දෙහිඅත්තවෙල ඇල පැති බැම්ම ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.784,000ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා ප්‍රදේශයේ මරණාධාර හා සහනාධාර සමිතියක් සමග රු.784,000 ක ගිවිසුමකට එළඹ තිබුණි. 2018 ජූලි 23 දින මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ඇති බව ප්‍රකාශ කර අදාල සමිතියවෙත රු.705,575 ක් (රැඳවුම් සියයට 10 ක් අඩුකිරීමෙන් පසු) ගෙවා තිබුණද,2018 දෙසැම්බර් 11 දින භෞතිකව පරීක්ෂා කරන අවස්ථාවේදී එකී ව්‍යාපෘතිය ඉදිකර නොතිබුණි. | ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූල වීම හා එයට පටහැනි වීම් සඳහා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වන බවත් මේ පිළිබඳව විමර්ශනයක් කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අග්‍රිම ඉල්ලුම් කිරීම් හා අග්‍රිම ලැබීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ සිට මැයි මාසය දක්වා ද, නොවැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වාද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉල්ලුම් කළ අග්‍රිමය ඉක්මවා රු.39,853,382 ක සිටරු.785,430,213 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් අග්‍රිම ලැබී තිබුණි. ජූනි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා රු.212,222,000 ක සිටරු.,525,659,000 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් අඩුවෙන්අග්‍රිම ලැබී තිබුණි. | අග්‍රිම අවශ්‍යතාව නිවැරදි ලෙස ඇස්තමේන්තු කර භාණ්ඩාගාර අග්‍රිම ඉල්ලුම් කළ යුතු වීම. | සමාලෝචිත වර්ෂයේ මුල් කාල සීමාවේ දී අතැති බිල්පත් පියවීම සඳහා (2017) අදාළ අමාත්‍යාංශ විසින් ඍජුවම මැදිහත්ව මහා භාණ්ඩාගාරයෙන් අක් මුදල් ලබා ගැනීමට පියවර ගැනීම නිසා අග්‍රිම ඉල්ලුම් කිරීමටත් පෙර අක් මුදල් ලැබීමත්, වර්ෂ අවසානයේ ප්‍රමාණවත් අක් මුදල් නොලැබීමත් ඊට හේතු වී ඇත. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16කට වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 22කින් අවශ්‍යතා 32ක් සඳහා ලබාදුන් රු.මිලියන 1,846ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂ අවසානයේ රු.මිලියන 1,062ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එකී ඉතිරිවීම් මුළු ප්‍රතිපාදනවලින් සියයට 11 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක පැවතිණි. | සළසා තිබුණු ප්‍රතිපාදනවලට අදාළව අග්‍රිම භාණ්ඩාගාරයෙන් ලබා ගැනීම සඳහා අවශ්‍ය සැලැසුම් නිවැරදි ලෙස සිදුකර අග්‍රිම ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වෙමි. |

## 2.3 තත්කාර්යඅතුරුඅග්‍රිමනිකුත්කිරීම්හාපියවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව විවිධ කාර්යයන් සඳහා ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්ය නිම කර දින 10ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03කට අදාළව 2017 හා 2018 වර්ෂ සඳහා ලබාගත් රු.495,392ක් වටිනා තත්කාර්ය අතුරු අග්‍රිම 46ක් නියමිත කාලය ඉක්මවා දින 01 ක සිට දින 54 ක් දක්වා කාල පමාවකින් පසුව පියවා තිබුණි. | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී මෙවැනි තත්ත්වයන් මග හරවා ගැනීමට කටයුතු කිරීම. |

## 2.4 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09කට අදාළව වර්ෂ 02ක් ඉක්ම වූ එකතුව රු.39,504,359ක් වූ තැන්පතු 187ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | භාණ්ඩාගාර අග්‍රිම නොලැබීම මත මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වීම. |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 485 (4) හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තුන් මාසයක් ඇතුළත පියවා ගත යුතුව තිබුණත්, 2018 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන්ගේ එකතුව රු.158,455 ක ණය ශේෂ මාස 03 ක සිට මාස 12 ක කාලයක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂ පියවා ගැනීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ණය ශේෂ නිරවුල් කළ යුතු ය. | ණය ශේෂ නිරවුල් කරන ලෙස අදාළ පාර්ශවයන්ට දන්වා යැවීම |
| (ආ) | විශ්‍රාම ගොස් මාස 03 සිට මාස 12 දක්වා කාල පරාසයක් තුළ කල්ගත වී තිබුණු එකතුවරු. 285,250ක් වූ ණය ශේෂ 03ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIVපරිච්ඡේදයේ 4 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | විශ්‍රාම වැටුප් පාරිතෝෂිතයෙන් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | අවසාන වාරිකය අයකර අවුරුද්දකට වඩා කල්ගත වී තිබුණු වැඩ තහනම් කළ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අය විය යුතු රු. 989,956ක ණය ශේෂ, එම ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට 2018 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු.333,306ක ණය ශේෂ 04ක් ඒ අතර විය. | ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගත යුතුවීම. | අයවීමට ඇති ණය ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------------

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණනන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සමාජ සංවර්ධන වැඩසටහන් 03ක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08ක් වෙත එකතුව රු.343,000ක ප්‍රතිපාදන ලබා දී තිබුණි.භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම නිසාඑකී කාර්යයන් ඉටු කර නොතිබුණි. | අක් මුදල් සැලැස්ම විධිමත් පරිදි පිළියෙල කර ඒ අනුව භාණ්ඩාගාරයෙන් අග්‍රිම ඉල්ලුම කළ යුතු වීම. | ප්‍රතිපාදන ලබා දී තිබුණ ද ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම මත මෙම කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම. |
| (ආ) | හටන්පොළ ගම්මානයේ සිටිනසියළු කම්මල්කරුවන් කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ ව්‍යාපෘතියකටධීවර, ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින්ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් වෙත රු.121,856ක ප්‍රතිපාදන සළසා තිබුණි.2019 මැයි 31 දින වන විටත් එම කම්මල්කරුවන් ලියාපදිංචිකර නොතිබුණි. | කාර්මික සංවර්ධන මණ්ඩලය සමග සමීප සම්බන්ධතාවයකින් යුක්තව කටයුතු කර ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු ඉටුකරවා ගැනීමට පියවර ගත යුතු වීම. | ග්‍රාමීය කර්මාන්තවලට අදාළ අධීක්ෂණ කටයුතු කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් මෙම කාල සීමාව තුළ සිදු නොකිරීම නිසා ලියාපදිංචිය සිදු නොකරන ලදී. |
| (ඇ) | 2018 වර්ෂයේ දී කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය ඉදිකිරීම සඳහා රු.5,000,000ක ප්‍රතිපාදන සළසා තිබුණත්,සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රතිපාදන ලබාගෙන ව්‍යාපෘති කඩිනමින් නිමකිරීමට පියවර ගත යුතු වීම. | ඇස්තමේන්තු අනුමත වී ඇතත් ප්‍රතිපාදන නොලැබීම මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීය. |
| (ඈ) | රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ෆාම්ගාර්ඩ්න් ගොළුවාවිල මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා වූ කර්මාන්තයේ ඉදිකිරීම් 2018 ජනවාරි 14 දින වන විට අවසන් කළ යුතුව තිබුණි. ඒ සඳහා වූ ඇස්තමේන්තුවේ වැඩ | අදාළ පාර්ශවයන් වෙත තොරතුරු ලබා දී ප්‍රතිපාදන ලබාගෙන ඉටු නොකළ වැඩ කොටස් කඩිනමින් නිම කිරීමට පියවර ගැනීම. | වෙන්ව ඇති ප්‍රතිපාදන සීමාව තුළ අත්‍යවශ්‍ය වැඩ කොටස් පමණක් කොන්ත්‍රාත්කරු ලවා ඉටු කරවා ගන්නා ලදී. |

විෂයයන් 10ක් වෙනුවෙන් රු.1,336,403ක් වූ වියදම් සඳහා ප්‍රතිපාදන නොලැබීම නිසා 2019 ජනවාරි 23 දින වන විටත් එම වැඩ කොටස් ඉටුකර නොතිබුණි.

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 හා 2018 වර්ෂවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක ක්‍රියාකාරී සැලැසුම් පරීක්ෂාවේදී ක්‍රියාකාරකම් 48කට අදාළවඅපේක්ෂිත ඉලක්ක හා තථ්‍ය තත්ත්වය අතර සියයට 6 ක සිට සියයට 69 ක් දක්වා පරාසයක අඩු ප්‍රගතියක් වාර්තා වී තිබුණි. ක්‍රියාකාරකම් 17ක් සම්බන්ධයෙන් පැවතුණ ඉලක්ක කරා ලඟා වී නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අපේක්ෂිත ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කිරීම. | අපේක්ෂිත ඉලක්කයන් හඳුනාගැනීමේදී පවතින දෝෂසහගත තත්ත්වය වලක්වා ගැනීම සඳහා ඉදිරියේ දී නිලධාරීන්ට පුහුණුවක් ලබා දීමට කටයුතු කිරීම. |
| (ආ) | 2015 ජූනි 15 දිනැති අංක 2008/04 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනටරජයේ ඉඩම් සඳහා බලපත්‍ර / දීමනාපත්‍ර නිකුත් කිරීමේ දී, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08ක පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන 01 ක සිට 08ක් දක්වා අඩු පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් කිසිදු ඉඩම් කච්චේරියක් පවත්වා නොතිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05කට අදාළව අනවසර ඉඩම් නියමානුකූල කිරීමට ඇති ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් නියමානුකූල කිරීම සඳහා හඳුනාගත් ප්‍රමාණය සියයට 0 ක සිට සියයට 50ක් දක්වා පරාසයකප්‍රමාණයක අඩු මට්ටමක පැවතුණි.එසේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක අනවසර ඉඩම් නියමානුකූල කිරීමට ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව පිළිබඳව තොරතුරු නිශ්චිතව | අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. | රත්නපුර දිස්ත්‍රික්කය තුළ ජනතාවට පදිංචියට සුදුසු ඉඩම්ඇත්තේ ඉතාමත් සීමිත ප්‍රමාණයක් වන බැවින් ඉඩම් නියමානුකූල කළ නොහැකි වීම. |

හඳුනාගෙන නොතිබීම හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය තුළ අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි.

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | ----------------------------- |
| (අ) | ගලගම ළඳුයාය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් රු.50,653,814ක ප්‍රතිපාදන සළසා තිබුණි.එම කොන්ත්‍රාත්තුව දින 37කින් ඉදිකර නිම කිරීමේ පදනම මත 2016 දෙසැම්බර් 14 දින බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සමග අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි.2017 දෙසැම්බර් මාසය වන විට කර්මාන්තයේ ඉදිකිරීම් වැඩ අතරමග නවතා දමා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 5 නොඅඩු එනම් රු. 2,532,691ක් වූ කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබීමත්,රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 මාර්ගෝපදේශය ප්‍රකාරව පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට කොන්ත්‍රාත්කරුගේ නම ඇතුළත් කිරීමට කටයුතු නොකිරීමත්,අවබෝධතා ගිවිසුම අවලංගු කර වෙනත් ආයතනයක්/කොන්ත්‍රාත්කරුවෙකු මගින් අදාළ කටයුත්ත ඉටුකර ගැනීමට කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | අදාල කොන්ත්‍රාත්කරු අසාධු ලේඛන ගතකර එම පාර්ශවය සමඟ වූ අවබෝධාත්මක ගිවිසුම අවලංගු කිරිමට කටයුතු කිරීම හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(අ) මාර්ගෝපදේශයප්‍රකාරව කටයුතු කළ යුතුවිම. | ඉදිකිරීම් වර්ෂ අවසානයට පෙර නිමකරන බවට බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය තහවුරු කළ ද එසේ සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. |
| (ආ) | රත්නපුර දිස්ත්‍රික්කයේ ආපදාවට | නියමිත කාල වකවානුව තුළ | අවිච්ඡේද ව්‍යාපෘති සඳහා |

| | | |
|---|---|---|
| ලක් වූ මාර්ග නඩත්තු වැඩසටහන යටතේ 2018 වර්ෂයට අවිච්ඡේද වූ රු.මිලියන 322.77ක් වටිනා ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 10ක සිට සියයට 97ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. ඉන් ඉදිකිරීම් 34ක් ප්‍රතිපාදන නොලැබීම නිසා කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිකිරීම් කටයුතු නතර කර අත්හැර තිබුණි. තවද 2019 පෙබරවාරි 06 දින වන විට ප්‍රතිපාදන නොලැබීම නිසාරු. මිලියන 25.71ක් වටිනා ව්‍යාපෘති 02ක කටයුතු අතහැර තිබුණි. මෙසේ අතහැර තිබුණු ව්‍යාපෘති වෙනුවෙන් මේ වන විට සිදු කළ වියදම් හා කාලය නිෂ්ඵල වී තිබුණි. | ව්‍යාපෘති ඉටු කිරීමට හැකි වන පරිදි සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රතිපාදන වෙන් වීමක් සිදු නොවීම මත ඉදිකිරීම් කටයුතු දිගටම පවත්වාගෙන යන ලෙස කොන්ත්‍රාත්කරුවන් හට උපදෙස් දීමට නොහැකි විම. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ------------------------ | ----------- | ------------------------ |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් වෙත ව්‍යාපෘති 39ක් ඉටුකිරීම සඳහා රු.මිලියන 429.82ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ව්‍යාපෘති ඉටු කිරිමේ ප්‍රමාදයන් හේතුවෙන් ඊට අදාළ සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 329.83ක් හෙවත් සියයට 76.7ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | නියමිත කාල වකවානුව තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකි වන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කිරීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වන අතර මෙම කරුණු දිස්ත්‍රික් ලේකම්ගේ පාලනයෙන් බැහැර කාරණා වීම. |
| (ආ) | 2016, 2017 හා 2018 වර්ෂයන්හිපැවති ගංවතුරින් හා නායයාම්වලින්රත්නපුර දිස්ත්‍රික්කයේ හානියට පත් මුළු නිවාස ගණන 16991ක් වී තිබුණි. ඒ සඳහා රු.1,075,757,044ක වන්දි මුදලක් ගෙවිය යුතුව තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත්ගෙවිය යුතු | භාණ්ඩාගාරය හා අදාළ රේඛිය අමාත්‍යාංශය සමඟ සමීප සම්බන්ධතාවයකින් යුක්ත අදාළ වන්දි මුදල් කඩිනමින් ගෙවීමට හැකිවන පරිදි කටයුතු සැලැසුම් කළ යුතු වීම. | වන්දි මුදල් ලබා දීමේ ප්‍රමාදයන් දිස්ත්‍රික් ලේකම් පාලනයෙන් බැහැර කටයුත්තක් වීම. |

| | | | |
|---|---|---|---|
| | වන්දි මුදලරු.327,713,533ක් වී තිබුණි. | | |
| (ඇ) | 2016, 2017 හා 2018 වර්ෂයන්හිපැවති ගංවතුරින් හා නායයාම්වලින් රත්නපුර දිස්ත්‍රික්කයේ විපතට පත් ජනතාව වෙත විකල්ප ඉඩම් ලබාදීමට හඳුනාගත් පවුල් සංඛ්‍යාව 2213ක් වී තිබුණි. එයින් යෝග්‍ය ඉඩම් පවුල් 882ක් වෙත පමණක් ලබා දී තිබුණි. | දැනට අත්පත් කරගෙන ඇති ඉඩම්වල මිනින්දෝරු වාර්තා කඩිනමින් ලබාගෙන ඉතිරි සැලකිය යුතු පවුල් සංඛාවක් වෙත ඉඩම් ලබාදීමට පියවර ගැනීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වන අතර මෙම කරුණු දිස්ත්‍රික් ලේකම්ගේ පාලනයෙන් බැහැර කාරණා වීම. |

**3.5 ප්‍රසම්පාදනයන්**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රත්නපුර දිස්ත්‍රික් ලේකම් නව ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ විගණන විමසුමෙන් පෙන්වා දුන් පරිදි අයකළ යුතු ප්‍රමාද දඩ මුදල රු.12,528,000ක් වී තිබුණි. 2018 ජූලි 12 දින වන විට 17 වන අන්තර් බිල්පත ගෙවන අවස්ථාව වන විට ප්‍රමාද දිනයන් සම්බන්ධයෙන් Contract Data 8.7 පරිදි කොන්ත්‍රාත් මුදලින් සියයට 5ක උපරිමය වූ රු.23,266,017ක් ද අය නොකර ගෙවීම්කිරීම නිසා එම මුදල කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණි. | ගිවිසුමේ 8.7 පරිදි කටයුතු කළ යුතු වීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් කටයුතු සිදුකර ඇත. |
| (ආ) | ඇස්තමේන්තු පිළියෙල කර අනුමත කර ගැනීමකින් තොරව රත්නපුර දිස්ත්‍රික් ලේකම් නව ගොඩනැගිල්ලේ ඉදි කර තිබූ ගබඩා කාමරයට වෙන් කරන ලද 225 mm ගඩොල් බැම්ම කඩා ඉවත් කර ඒ වෙනුවට සිමෙන්ති අච්චු ගල් බැම්මක් එම ස්ථානයේම | විධිමත් පරිදි ඇස්තමේන්තු පිළියෙල කර අනුමත කිරීමෙන් පසුව ඉදිකිරීම් ආරම්භ කිරීමට පියවර ගත යුතු වීම. | මූලික ඇස්තමේන්තුවක් සැකසීම කොන්ත්‍රාත්කරුට අසීරු කාර්යයක් බවත් 2018 නොවැම්බර් 22 දින මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී |

| | | |
|---|---|---|
| ඉදිකර තිබුණි. | | කොන්ත්‍රාත්කරු, උපදේශන ආයතනය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් ඒකමතිකව තීරණයක් ගෙන එම ඉදිකිරීම් කඩිනමින් සිදු කිරීමටත් පසුව ඇස්තමේන්තුව අනුමත කිරීමටත් තීරණය කිරීම. |

**3.6 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේරු.මිලියන 2.5ක වියදමින් ඉදිකරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සේවා පියස කාර්යාල 02ක ඉදිකිරීම් කටයුතු 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. 2018 ඔක්තෝබර් 29 දින වන විටත් එම ගොඩනැගිලි නිෂ්කාර්යව තිබුණි. | සංවර්ධන ව්‍යාපෘති යටතේ ඉදිකළ ගොඩනැගිලි කාර්යක්ෂමවඋපයෝජනය කළ යුතු වීම. | එක් සේවා පියස කාර්යාලයක් දැනටමත් භාවිතා කරන අතර අනිත් සේවා පියස කාර්යාලය භාවිතයට ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු පොදු සේවා නිවාස දෙක සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | අදාළ දේපල විධිමත් ලෙස උපයෝජනය කරගැනීමට පියවර ගත යුතු වීම. | පොදු සේවා නිවාස දෙක අළුත්වැඩියා කටයුතු මට්ටමේ පවතින බැවින් එම නිවාස දෙක අළුත්වැඩියා කර නියමානුකූල කිරීමට කටයුතු කිරීම. |

### 3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16ක ඇප තැබිය යුතු නිලධාරීන් 86 දෙනෙක් විසින් අදාළ ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. මුදල් රෙගුලාසි 881 (ii) සඳහන් විධිවිධාන ප්‍රකාරව සිය යටත් නිලධාරීන්ගෙන් නියමිත කාල සීමාව ඇතුළත ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 හා 881 (ii) ප්‍රකාරව ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මේ සඳහා කටයුතු සිදු කරමින් පවතී. |

### 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් විසින් නිවැරදි කිරීම් සිදුකර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ. | | |

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය | | |
| --- | --- | --- | --- | --- |
| **වර්ෂය** | **ඡේද අංකය** | | | |
| 2008 | 10(ඇ)(1) | මග නැගුම වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වතුයාය මංසන්ධියේ සිට වෙල මැදින් උඩකඩ දක්වා වූ | පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර නිසි පියවර ගැනීම හා ඉදිකිරීම් සම්බන්ධයෙන් නියමිත ප්‍රමාණයන් සඳහා නියමිත | මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර වාර්තා කිරීමට කමිටුවක් පත් කර තිබීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | මාර්ගය සඳහා යොදා තිබුණු කොන්ක්‍රීට් තට්ටුව සඳහා නොයෙදූ කොන්ක්‍රීට් කියුබ් 09ක් වෙනුවෙන් රු.159,279 ක් වැඩිපුර ගෙවා තිබීම. | රේටයන් අනුව ගෙවීම් කළ යුතුවීම. | |
| | 2013 | 1.7(අ)(1) | කුරුවිට ප්‍රාදේශීය ලේකම් නිල නිවසේ පැවැති පැරණි වහලය ලී රාමුව යොදා අළුතින් සකස් කිරීම වෙනුවෙන් රු.241,316 ක් ගෙවා තිබුණද, ඒ සඳහා පැරණි වහලයේ තිබුණු යට ලී හා පරාල යොදා ගෙන තිබීම. | මෙම ගෙවීම් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට අදාළව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනිම. | සිද්ධිය සම්බන්ධ කාර්මික නිලධාරිනිය පළාත් සභාවට අනුයුක්ත බැවින් මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ පදනම් කර ගෙන අවශ්‍ය කටයුතු සඳහා මූලික විමර්ශන වාර්තාවේ පිටපතක්ද සමඟ චෝදනා පත්‍ර කෙටුම්පතක් සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇත. |
| | 2015 | 3.12(ඇ)(iv) | 2010 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ නමුත් 2015 දෙසැම්බර් මාසය වන විටත් ඒවායේ වැඩ කටයුතු නිම කර අරමුණුගත කාර්යයෙහි යෙදවීමට අපොහොසත් වීම නිසා සංස්කෘතික මධ්‍යස්ථාන 05ක් ඉදිකිරීම වෙනුවෙන් එම කාලපරිච්ඡේදය තුළ වැය කළ රු.12,952,497ක් නිෂ්ඵල වී තිබීම. | සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂමව හා ඵලදායිව සිදු කළ යුතුවීම. | ඉතිරි වැඩ සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතී. |
| (ආ) | ක්ෂේත්‍ර නිලධාරීන් හට සහන පදනම මත යතුරු පැදි ලබාදීමට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක් සම්බන්ධයෙන් සිදුකළවිගණන පරීක්ෂාවන්ට අනුව තවදුරටත් ප්‍රාදේශීයලේකම් කාර්යාල 02ක නිලධාරීන්තිදෙනෙකුවිසින් එකතුවරු.428,340කවාරික මුදල් හිඟ හිට පැවතුණ අතර එම මුදල් අයකර ගැනීමට කාර්යාලයන් අපොහොසත් වීතිබුණි. | | | අදාළ නිලධාරින්වෙතින් හෝ එම නිලධාරින් මුදා හළපාර්ශවයන් වෙතින් හෝ අදාළ මුදල අය කර ගැනීමට ක්‍රියා කළ යුතුය. | දිගින් දිගටම මෙම කරුණ සම්බන්ධයෙන් නිලධාරියා සහ ඔහුගේ සේවා ආයතන දැනුවත් කළ ද, මෙතෙක් මුදල් ගෙවීමට කටයුතු කර නොමැති බව |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිඳු අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීමක්, ක්‍රියාකාරී සැලැසුම් පිළියෙල කිරීමක් හෝ මගපෙන්වීමක් සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ විගණන වාර්තාව මඟින් පෙන්වා දී ඇති නමුත් ඒ පිළිබඳව විගණිත දිනය වූ 2019 මාර්තු 05 දින වන විටත් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාළ අරමුණු හා ඉලක්ක පිළිබඳව ඵලදායීව දැනුවත් කිරීම සඳහා චක්‍රලේඛ හා මගපෙන්වීම් යොදා ගත යුතු බවත්, ආයතනයට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. | 2019 මැයි 22 දින පවත්වන ලද සාකච්ඡාවට අනුව මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

**5.** **යහපාලනය**

---------------

**5.1** **මහජනයා වෙත සේවා ඉටු කිරිම**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආයතන අංශයේ අවසර පත්‍ර ලබා දීම් ශාඛාවේ දැව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම, සතුන් ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම හා සුරාබදු බලපත්‍ර නිකුත් යන කාර්යයන් ඉලක්කය ඉක්මවා සියයට 8 සිට සියයට 117 දක්වා ඉටුකර තිබීම සමාජ හා පාරිසරික හිතකර භාවය සඳහා අහිතකර ලෙස බලපෑ හැකි බව විගණනයේ අදහස වේ. | කාර්යයන් ඉටු කිරීමේදී පාරිසරික හිතකරභාවය පිළිබඳව සැළකිලිමත් විය යුතු ය. | මෙයට හේතුව වාර්ෂිකව කරන ලද ඉලක්කයන්ගේ දෝෂ සහගත තත්ත්වයන් පැවතීම බව |